# Abstract No 61

## ආයුර්වේදීය රෝග රෝගී පරීක්ෂාවෙහි සහ රෝග විනිශ්චයෙහි දී අනුමාන ප්‍රමාණයෙහි වැදගත්කමඃ විමර්ශනයකි

**වේවැල්වල එස්.එල්[1], සමරතුංග යූ.[1], ජයවර්ධන කේ.බී.[2]**
[1]ආයුර්වේද මූලධර්ම අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය
[2]සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

නිරෝගී පුද්ගලයාගේ නිරෝගතාව රැකීමත්, ආතුරයාගේ රෝගය සංසිඳවීමත් ආයුර්වේදයෙහි ප්‍රධාන අරමුණු වෙයි. ඉහත අරමුණු සාක්ෂාත් කිරීම සඳහා නිවැරදි රෝග-රෝගී පරීක්ෂාව සහ රෝග විනිශ්චය ඉතා වැදගත් වේ. රෝගයක් පිළිබඳ විශේෂ විඥානය ලබා ගැනීම සඳහා ආප්තෝපදේශ, ප්‍රත්‍යක්ෂ සහ අනුමානය යන ප්‍රමාණත්‍රය යොදා ගත යුතු බව චරකය පෙන්වා දෙයි. වර්තමාන රෝග විනිශ්චයෙහි දී වෛද්‍ය රසායනාගාර පර්යේෂණයන්ට ප්‍රමුඛ ස්ථානය ලබා දී ඇති බව පැහැදිලි කරුණකි. ඒ මත පමණක් පිහිටා ආයුර්වේදීය රෝග-රෝගී පරීක්ෂාව සිදු කල නොහැක. ආප්තෝපදේශය පාදක කොට ගනිමින් ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂය සහ අනුමානය ඔස්සේ වෛද්‍යවරයා විසින් රෝග විශේෂ විඥානය ලබා ගත යුතු ය. මෙම පර්යේෂණය මගින් රෝග-රෝගී පරීක්ෂාව සහ රෝග විනිශ්චය කිරීම සඳහා අනුමාන ප්‍රමාණය භාවිතයෙහි වැදගත්කම අධ්‍යයනය කෙරිණි. දත්ත රැස්කිරීම සඳහා පුස්තකාල භාවිතයෙන් ආයුර්වේද මූලික සංහිතා ග්‍රන්ථයන්, වෙනත් ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයට අදාළ ග්‍රන්ථයන් සහ දර්ශන ශාස්ත්‍රයනට අදාළ ග්‍රන්ථයන් ද උපයෝගී කරගනු ලැබිණි. අනුමානය යනු යුක්තිය හා තර්කය මත පදනම් වූ සත්‍ය ඥානය ලබා ගැනීමේ ක්‍රියාවලියකි. එය කාලත්‍රයෙහි ම භාවිත වන කාලත්‍රය ම විෂය වන ඥානය ලබා ගැනීමේ ක්‍රමවේදයකි. එය ප්‍රත්‍යක්ෂය පෙරටුකොට ඇතිකර ගනු ලබන අතර වෛද්‍යවරයා විසින් ගොඩනගා ගත යුතු කුසලතාවක් තුළින් ලබා ගන්නා ඥානයකි. ආප්තෝපදේශ සහ ප්‍රත්‍යක්ෂය භාවිතය මගින් රෝග නිදානය අනුමාන කරයි. නිදාන පරිවර්ජනය ආයුර්වේදීය චිකිත්සාවෙහි මූලිකම අංගයයි. අනතුරු ව නිදාන කාරණයට අනුව ගුරු ආදී ගුණයන්හි ක්ෂය-වෘද්ධි හඳුනාගැනීම ද ඒ අනුව ශාරීරික සහ මානසික දෝෂයන්හි ක්ෂය-වෘද්ධි-කෝප ආදිය ද රසාදියෙහි විෂමතාව ද අනුමාන කරනු ලැබේ. තව ද රෝගියාගේ ධාතුවල ස්වභාවය, ශාරීරික සහ මානසික බල දුබලතාව, අග්නි බල - දුබලතාව සහ ස්‍රෝතස් දෘෂ්ටි ලක්ෂණ ආශ්‍රයෙන් පුද්ගලයාගේ ස්‍රෝතස්හි තත්ත්ව නිර්ණය කිරීම සඳහා අනුමාන ප්‍රමාණය වැදගත් වේ. මෙමගින් රෝග-රෝගී පරීක්ෂාව ද රෝග විනිශ්චය ද සිදු කරනු ලබයි. නව්‍ය වෛද්‍ය පරීක්ෂණ මගින් ඉහත ආකාරයේ පරීක්ෂාවක් සිදුකළ නොහැක. විමර්ශනය අනුව ආයුර්වේදීය රෝග-රෝගී පරීක්ෂාව සහ රෝග විනිශ්චය සඳහා අනුමාන ප්‍රමාණය භාවිතය ඉතා වැදගත්වන නිගමනය කළ හැක.

**ප්‍රමුඛපද -** අනුමාන ප්‍රමාණය, ආයුර්වේදය, රෝග, රෝගී පරීක්ෂාව